# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## Police Media Division


තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No – 517

ෆැක්ස් / தொலை நகல் / Fax – 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone – 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail – dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No – 1065 / 2022

ඔබේ අංකය / உமது இல / Your No –

දිනය / திகதி / Date – 2022.07.22 පැය 1530

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ජනාධිපති ලේකම් කාර්යාලය තුල රැඳී සිටි නීති විරෝධී රැස්වීමක සාමාජිකයින් ඉවත් කිරීමට කටයුතු කිරීම .**

ජනාධිපති ලේකම් කාර්යාලයේ නීති විරෝධී ලෙස රැඳී සිටි පිරිස 2022.07.22 වන දින අළුයම් කාලයේදී ඉන් ඉවත් කිරීම ශ්‍රී ලංකා පොලිසිය, ත්‍රිවිධ හමුදාව හා පොලිස් විශේෂ කාර්ය බලකාය සමග ඒකාබද්ධ මෙහෙයුමක් මගින් සිදු කරන ලදී.

එම අවස්ථාවේ එහි රැඳී සිටි පිරිස් ගොඩනැගිල්ලෙන් පිටතට යැවීමට කටයුතු කරන ලද අතර ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉදිරිපස ප්‍රධාන දොරටුව හා එම දොරටුවට බාධා කරමින් අවට රැඳී සිටි පිරිසද එම ආකාරයටම ඉවත් කිරීමට කටයුතු කර ඇත. ජනාධිපති ලේකම් කාර්යාලයට බාධාවක් වන ආකාරයෙන් පදික වේදිකාවේ තාවකාලිකව ඉදි කර තිබූ කූඩාරම්ද ඉවත් කිරීමට කටයුතු කරන ලද අතර මෙහිදී සැකකරුවන් 09 දෙනෙකු අත්අඩංගුවට ගැනීමටද සිදුවිය.

මෙම විරෝධතාකරුවන් පිරිස 2022.07.09 වන දින සිට ජනාධිපති ලේකම් කාර්යාලය තුල රැඳී සිටිමින් එය ඔවුන්ගේ පරිශ්‍රයක් බව හඟවමින් එම ස්ථානයට යන ආරක්ෂක නිලධාරින්ට පවා බාධා කරමින්, පරිභව කරමින් කටයුතු කල අතර පොලිස් නිලධාරීන් පවා ඔවුන් සිටින ස්ථානවලට ගිය අවස්ථා වලදී එම නිලධාරින්ටද ඔවුන් සිටි ස්ථානවලින් ඉවත් වන ලෙසට දැනුම්දෙන අවස්ථා දක්නට තිබිණි. රාජ්‍ය පාලනයේදී ඉතාම වැදගත් මෙන්ම භාරදූර්ය කාර්යයක් ඉටු කරන කාර්යාල පද්ධතියක් මෙම විරෝධතාකරුවන් විසින් නීති විරෝධී ලෙස අත්පත් කර ගෙන තිබුණි. රටේ මහජනතාවගේ අවශ්‍යතාවයන් සඳහා විවිධ තීන්දු තිරණ ගනු ලබන කාර්යාල පද්ධතියෙන් සාමකාමීව ඉවත් වන ලෙසට අදාල නීත්‍යානුකූල බලධාරින් අවස්ථා කිහිපයකදී ඉල්ලා සිටියද නොයෙකුත් විවිධ කොන්දේසි ඉදිරිපත් කරමින් ඔවුන් විසින්ම විවිධ දින වකවානු නියම කරමින් මෙම ස්ථානයේ රැඳී සිටීමට උත්සහ කරන බව ආරක්ෂක අංශයන් වෙත නිරික්ෂණය විය.

**කෙසේ වුවද 2022.07.14 වන දින කොළඹ මධ්‍යම කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාත්, කොළඹ මධ්‍යම දිස්ත්‍රික් iii භාර සහකාර පොලිස් අධිකාරීවරයාත්, 2022.07.18 වන දින නැවත වරක් කොළඹ මධ්‍යම කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාත්, කොළඹ මධ්‍යම දිස්ත්‍රික් iii භාර සහකාර පොලිස් අධිකාරීවරයාත්**

**කොටුව වැඩබලන පොලිස් ස්ථානාධිපතිවරයාත් මෙම විරෝධතාකරුවන් හමුවී ජනාධිපති ලේකම් කාර්යාලයෙන් සාමකාමීව ඉවත් වන ලෙසට ඉල්ලා සිටි අතර එම අවස්ථාවලදී ඉවත්ව යාම ප්‍රතික්ෂේප කරමින් ආවේගශීලීව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත ප්‍රතිචාර දක්වා තිබිණි.** එම ගොඩනැගිල්ල තුල තිබෙන වටිනා රජයට අයත් දේපල හා ලියකියවිලි වලට හානි සිදුවන බව තවදුරටත් නිරික්ෂණය වෙමින් තිබූ අතර එම පිරිස් ඉවත් කිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් ආරක්ෂක අංශවලට පවා සාමයට ලැදි මහජනතාවගෙන් චෝදනා එල්ල වී තිබුණි.

සියළු තත්ත්වයන් සලකා බැලීමෙන් පසු වෙනත් විකල්ප ක්‍රියාමාර්ගයක් නොතිබූ බැවින් මේ ආකාරයට විරෝධතාකරුවන් එම ස්ථානයෙන් ඉවත් කරන ලද අතර විරෝධතාවයේ යෙදීමට අවශ්‍ය නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පුරවැසියෙකුට ලබා දී ඇති අයිතිවාසිකම් වල සීමාවන් හැඳිනගෙන නිත්‍යානුකූලව හා සාමකාමීව විරෝධතාවයේ යෙදෙන ලෙසට ඔවුන්ට දැනුම් දෙන ලද අතර තර්ජනය කරමින්, බලපෑම් කරමින් ප්‍රචණ්ඩත්වය හෝ කලහකාරීත්වය මුදා හරිමින් මහජන සාමයට බාධා හා හිරිහැර වන අයුරින් කටයුතු කලහොත් මහජන සාමය පවත්වා ගැනීම සඳහා ඊට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියා කිරීමට සිදුවන බවද අවධාරණය කරන ලදී.

එසේම විරෝධතාවය දැක්වීමේදී අන් අයගේ මතයන්ට ගරු කරමින් රාජ්‍ය දේපල ආරක්ෂා වන ආකාරයට කටයුතු කල යුතු වන අතර එසේ නොවන අවස්ථාවන් වලදී නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් මැදිහත් වනු ඇත. මෙම විරෝධතාකරුවන් ඉවත් කිරීමේදී ද ප්‍රතිවිරෝධය දැක් වූ විරෝධතාකරුවන් පාලනය කිරීම සඳහා යම් ක්‍රියාමාර්ග ගැනීමට ආරක්ෂක නිලධාරීන්ට සිදු වූ අතර නිත්‍යානුකූලව කටයුතු කරන්නේ නම් කිසිදු විරෝධතාකරුවෙකුට එරෙහිව බලය පාවිච්චි කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවේ. යම් ස්ථානයකට ඇතුල් වීම, සෝදිසි කිරීම, අත්අඩංගුවට ගැනීමට සාමාන්‍ය නීතිය යටතේ පොලිස් නිලධාරීන්ට අවශ්‍ය පරිදි බලය පැවරී ඇති අතර වර්තමානයේ පවතින හදිසි නීති රෙගුලාසි යටතේ පොලිස් නිලධාරීට මෙන්ම ත්‍රිවිධ හමුදා නිලධාරීන්ටද එම බලය පැවරී ඇත. ඒ අනුව ආරක්ෂක අංශ නිලධාරීන් ඔවුන් වෙත පැවරී ඇති නෛතික බලතල ප්‍රකාරව එසේ නීති විරෝධීව රැඳී සිටි නීති විරෝධි රැස්වීමක සාමාජිකයින් ඉවත් කිරීමට කටයුතු කර ඇති බව අවධාරණය කළ යුතුය.

පොලිස් නිලධාරීන් විසින් මෙම විරෝධතාකරුවන් අතරට ගිය අවස්ථා ගණනාවකදී නිලධාරීන්ට හිරිහැර හා බාධාවන ලෙසත්, අපහසුතාවයට පත්වන ලෙසටත් හා පරිභව කරන අවස්ථාවන්ද සිදුව ඇති අතර ඉන් එක් අවස්ථාවකට අදාල විඩියෝ පටයක් ඔබගේ දැන ගැනීමට හා මාධ්‍ය මගින් ප්‍රචාරය සඳහා මේ සමඟ යොමු කරමි.

පොලිසිය යනු සමාජයේ නීති ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ආයතනයක් වන අතර එයට අභියෝග කිරීම තුල සමස්ථ සමාජයේම නීතිය ක්‍රියාත්මක කිරීම අභියෝගයට ලක්වේ. ඒ තුල සාමය අගයන නීතිගරුක පුද්ගලයන්ට අගතියක් සිදු වන අතර ශ්‍රී ලංකාවාසී සියලු මහජනතාවගෙන් පොලිසිය නිරන්තරයෙන් ඉල්ලා සිටින්නේ විරෝධතා දැක්වීම සාමකාමීව දක්වන ලෙස සහ නීතියේ රාමුව තුල කටයුතු කරන ලෙසය. අන් අයගේ අයිතිවාසිකම් වලට බාධාවන අයුරින් ප්‍රචණ්ඩකාරී හා කලහකාරී විරෝධතාවයන්වල යෙදීම නිසා මහජන සාමය කඩවන ලෙස සහ අත්‍යාවශ්‍ය සේවා පවත්වා ගෙන යාමට බාධාවන අයුරින් කටයුතු සිදුකරන්නේ නම් ඒවැනි අවස්ථා වලදී මහජන සාමය ආරක්ෂා කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට පොලිසිය කිසි විට පසුබට නොවන බව සඳහන් කල යුතුය.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**